**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**
**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවිය යුතු රු.31,098,930 ක වටිනාකම හා එදිනට මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය වූ රු.462,481 සමග සැසදීම සඳහා උක්ත චක්‍රලේඛයේ 7(vi) ප්‍රකාරව පිළියෙල කළ යුතු අග්‍රිම සැසඳුම් ගිණුම නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුවේ. | අග්‍රිම සැසදීමේ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී හර සහ බැර ශේෂයන් ඇතුළත් කිරීමේ දෝෂයන් ඇති බව පිළිගනිමි. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 10 ක් අතර මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ මාරු කර තිබූ රු.178,550,000 ක ප්‍රතිපාදන හා ප්‍රාග්ධන වැය විෂයයන් 09 ක් අතර මාරු කර තිබූ රු.78,375,000 ක ප්‍රතිපාදන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව හඳුන්වා දී තිබූ ඒසීඒ - 2 (i) ආකෘතියෙහි ඇතුලත් කර නොතිබුණි. | -එම- | මාරුකිරීම් පිළිබඳ වූ අගය චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව ඒසීඒ - 02 ආකෘතියේ ඇතුළත් කර නොමැති බවට සිදු කර ඇති නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (ඇ) | උක්ත චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එම වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම කේවල වත්කම් වටිනාකම් සමඟ පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බවට ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කිරීම කල යුතු විය. එහෙත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ලෙජර් ශේෂ වටිනාකම ශුන්‍ය අගයක් බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර තිබීම නිසා චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් ශේෂ වටිනාකම සැසඳීමක් කර තිබුනෙ ද යන්න විගණනයේ දී තහවුරු නොවුණි. තවද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි දක්වා තිබූ රු.8,475,769,546 ක්වූ මූල්‍ය නොවන වත්කම්වල | -එම- | මූල්‍ය ප්‍රකාශනවල එම වත්කම් වටිනාකම දක්වා ඇත්තේ රථවාහන සහ ඉඩම්වල අගය අඩුවෙන් වන අතර එම වත්කම්වල වටිනාකම සහිතව සම්පූර්ණ වත්කම් ලේඛනයක් දැනට පිළියෙල කරමින් පවතී. |

නිවැරදිතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

### 1.6.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත 07 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක් එහි සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකි විට ප්‍රත්‍යාගණිත අගයට වාර්තා කල යුතුය. ඒ අනුව දේපල, පිරියත, යන්ත්‍රෝපකරන හා අයිතමවල සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් වන හා ඉක්මන් වෙනස්වීම්වලින් යුක්ත වන බැවින් සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනයක් කල යුතු වුවත් කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට අදාල ඇතැම් යන්ත්‍රෝපකරණ පිරියත මිලදී ගත් දිනයේ සිට වර්ෂ 25 ත් 93 ත් දක්වා දීර්ඝ කාලපරාසයක් තුල ක්ෂය කර තිබුණි. ඒ අනුව යන්ත්‍රෝපකරණ ක්ෂය කිරීමේ දී ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳව නිවැරදිව තක්සේරු කර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට යන්ත්‍රෝපකරණවල සාධාරණ වටිනාකම නිරූපණය වී නොතිබුණි. | වත්කම් නිසි පරිදි තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම්වල ගැලපිය යුතු වේ. | බන්ධනාගාර ආයතන වල තිබෙන යන්ත්‍රෝපකරණ ඉතා පැරණි ඒවා බැවින් හා ඒවා දැනට වෙළෙඳ පළෙහි නොමැති වීම හේතුවෙන් ද ඒවායේ වෙළෙඳ පල වටිනාකම නිශ්චය කර ගැනීමට අපහසු වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අත්තිකාරම් ගිණුමට අදාල වසර 75 ක් පැරණි පිරිවැය රු.95,100 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 21 ක් ද, වසර 50 සිට 75 දක්වා පිරිවැය රු.216,630 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 33 ක් ද, වසර 25 සිට 50 දක්වා පිරිවැය රු.315,514 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 42 ක් ද ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් කර තිබුණි. එබැවින් යන්ත්‍රෝපකරණ ක්ෂය කිරීමේ දී ඵලදායී ජීවකාලය පිළිබඳව නිවැරදිව තක්සේරු කර නොමැති බවත් ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට යන්ත්‍රෝපකරණවල සාධාරණ | යන්ත්‍රෝපකරණවල ජීවකාලය පිළිබඳව තක්සේරු කර සාධාරණ වටිනාකම නිරූපණය කළ යුතුවේ. | බන්ධනාගාර ආයතනවල තිබෙන යන්ත්‍රෝපකරණ ඉතා පැරණි ඒවා බැවින් හා ඒවා දැනට වෙළෙඳ පළෙහි නොමැති වීම හේතුවෙන් ද ඒවායේ වෙළෙඳපල වටිනාකම නිශ්චය කර ගැනීමට අපහසු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම නිරූපණය වී නොමැති බවත් නිරීක්ෂණය කෙරේ. | | |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය වූ රු.50,383,707 ක් තුල රාජ්‍ය අංශයට අදාලව රු.50,348,089 ක හා පෞද්ගලික අංශයට අදාලව රු.35,618 ක ණයගැති ශේෂ පැවතුණි. එම ශේෂයන් තුල ඇතුලත් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.9,876,027 ක් ද, වර්ෂ 05 කට වැඩි වර්ෂ 10 කට අඩු රු.13,192,402 ක් ද, හා වර්ෂයකට වැඩි හා වර්ෂ 05 කට අඩු රු.12,868,859 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ණය අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර රැස්වීම් වාර 09 ක් පවත්වා තිබුණ ද තවදුරටත් රු.31,846,100 ක නිරවුල් කළ යුතු බිල්පත් 463 ක් 2019 මැයි 24 දිනට පවතින, බැවින් ණය අයකර ගැනීම මන්දගාමී තත්ත්වයක පැවතුණි. | 2015 වර්ෂයට පෙර ණය අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට පත්කර තිබූ කමිටුව වැනි කමිටුවක් පත්කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් මඟින් 2015 වර්ෂයට පසු ණය අයකර ගැනීම සඳහාද උපයෝගිකර ගැනීම සුදුසු වේ. | දැනට පත්කර ඇති කමිටුවේ උපදෙස් අනුව මෙම බිල්පත් පියවා ගැනීමට දැනටමත් කටයුතු කරමින් පවතී. |

### 1.6.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනතේ 107 ඡේදය | බන්ධනාගාර ආයතනයක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේ දී සිරගත සැකකරුවන් ලඟ තිබී නිලධාරීන් භාරයට ගනු ලැබූ වසර 03 ක් හෝ ඊට අඩු කාලයක් තුළ ඔවුන්ට ආපසු භාර දිය යුතු රු.538,852 ක මුදලක් හා රන් භාණ්ඩ වැනි අදාල පුද්ගලික දේපළ, පහසුවෙන් හඳුනාගතහැකි වන පරිදි වෙන් වෙන් වශයෙන් | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුවේ. | ආඥාපනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | බහලුම්වල යොදා නොතිබුණි. එසේම එම බහලුම්වල සිරකරුගේ/ සැකකරුගේ නම සහ ලියාපදිංචි අංකය සහිතව ලේබල් කර මුද්‍රා තබා ජේලර් භාරයේ සේප්පුවක තැන්පත් කර තැබිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | | |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| **(i).** XIX පරිච්ඡේදය 6.4 වගන්තිය | අධිකාරී නියෝග මත නිලධාරීන්ට ලබා දී තිබූ නිල නිවාසවලින් නිවාස 02 ක් එම නිලධාරීන් විසින් වෙනත් නිලධාරීන්ට කුලියට ලබා දී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතුවේ. | විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| **(ii).** XIX පරිච්ඡේදය 6.14, 6.14.1, 7.2 වගන්ති | ස්ථාන මාරු වීම හා බඳු කාල සීමාව ඉක්මවීම යන හේතු මත රජයේ නිවාසයක පදිංචි වීම සඳහා ඇති සුදුසුකම අහෝසි වීමෙන් පසුව ද නිල නිවාස තුල තවදුරටත් පදිංචිව සිටින නිලධාරීන් 13 දෙනෙකු වෙතින් අයකල යුතු රු.2,666,304 ක දණ්ඩන කුලිය අයකරගෙන නොතිබුණි. | -එම- | මෙම නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.14 ප්‍රකාරව කටයුතු කිරීමට දන්වා ඇත. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 215 | කුරුවිට බන්ධනාගාරය විසින් ද්‍රව්‍ය සැපයීමට පෙර ඊට අදාල සම්පූර්ණ මුදල වූ රු.2,009,880 ක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණු අතර බස් රථ 02 ක් අළුත්වැඩියාවට ප්‍රථම අළුත්වැඩියා ගාස්තු ලෙස රු.481,475 ක් ගෙවා තිබුණි. තවද | මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුගමනය කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. මුදල් රෙගුලාසිවල සඳහන් කරුණු උල්ලංගනය |

| | | |
|---|---|---|
| ඊට අදාල වවුචර් පිළියෙල කිරීමේ දී මු.රෙ.136, 137, 138 හා 139 යන රෙගුලාසි අනුගමනය කිරීමත් සිදු කර නොතිබුණි. | | කිරීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ට අවවාද කිරීමට හා ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයය 1203 යටතේ ආහාරපාන හා නිල ඇඳුම් සඳහා සලසාගෙන තිබූ රු.මිලියන 80 ක පරිපූරක ප්‍රතිපාදනවලින් සියයට 60 ක් එනම් රු.මිලියන 48.26 ක් ඉතිරිව තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | බිල්පත් පියවීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් ලබා නොදීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයය 08 ක් සඳහා වෙන් කර තිබූ රු.මිලියන 436 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් ද ඇතුළත්ව රු. මිලියන 87.56 ක වියදම් දරා තිබීමෙන් හා මෙම වැය විෂයයන් අතරින් වැය විෂයයන් 05 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ රු.මිලියන 44.3 ක ප්‍රතිපාදන මාරු කර තිබීමෙන් ඇස්තමේන්තු තාත්ත්වික පදනමකින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | - එම - | රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයන් සිදුවීම, ඊට අදාලව අතිකාල දීමනා රේටයන් ඉහළයාම, සංයුක්ත දීමනාව ඉහළයාම හා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන වෙන් කිරීමේ දී අදාල සීමාවන් අවම කර ප්‍රතිපාදන නිකුත් කිරීම මේ සඳහා හේතුවී තිබුණි. |
| (ඇ) | බන්ධනාගාර ආයතන 03 ක ඉදිකිරීම් සඳහා 2104 වැය විෂයය යටතේ වෙන් කරගෙන තිබූ රු.මිලියන 710 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 38.5 ක මූලධන ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර එම | - එම - | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. වර්ෂය තුළ ක්‍රමානුකූලව අක්මුදල් නොලැබීම මත ඉදිකිරීම් සමාගම අපේක්ෂිත භෞතික කාර්යසාධන මට්ටමට ලඟා නොවීම |

| | | | |
|---|---|---|---|
| | මාරු කර තිබූ ප්‍රතිපාදන ද ඇතුලත්ව සියයට 61 ක් එනම් රු.මිලියන 435.28 ක ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබුණි. මාරු කර තිබූ ප්‍රතිපාදන ඇතුලත්ව එම එක් එක් වැය විෂයයන් හි ප්‍රතිපාදන ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 51 සිට සියයට 73 දක්වා පරාසයක පැවතුණි. | | හේතුවෙන් මූලා කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන්, දුර්වලතාවයන් හා වර්ෂය අවසානයේ ප්‍රසම්පාදනය සැලසුම් කිරීම හේතුවෙන් මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ රු.මිලියන 96.6 ක ප්‍රතිපාදනවලින් සියයට 45 ක් එනම් රු.මිලියන 43.79 ක් ඌන උපයෝජිතව පැවතුණි. එම එක් එක් වැය විෂයයෙහි ප්‍රතිපාදන ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 46 ක් හා සියයට 43 ක් විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි මෙහෙය විය යුතුවේ. | ආරක්ෂිත උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අදාල කටයුතුවල සිදු වූ ප්‍රමාදය හේතුවෙන් හා තාක්ෂණ මණ්ඩලය මගින් අදාල ප්‍රසම්පාදනය අත්හිටුවීමේ තත්ත්වය මත අපේක්ෂිත ආකාරයෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි විය. |
| (ඉ) | ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ මන්නාරම සිර මැදිරිය ඉදිකිරීම සඳහා 2104(9) වැය විෂයයට මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ මාරු කර තිබුණු රු.මිලියන 26.5 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. | සැලසුම් සහගතව ප්‍රතිපාදන මාරු කර ගත යුතුවේ. | ඉදිකිරීම් සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අදාල භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත භූමියක් බව ප්‍රකාශ කිරීමත් සමග ඉදිකිරීම් කටයුතු නවතා ඇති බැවින් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි විය. |
| (ඊ) | මූලධන වැය විෂයය 02 ක් සඳහා වෙන් කර තිබූ රු.මිලියන 30 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් ද ඇතුළත්ව රු.මිලියන 15.68 ක වියදම් දරා තිබීමෙන් හා මෙම වැය විෂයයන් දෙක සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ රු.මිලියන 14.5 ක ප්‍රතිපාදන මාරු කර තිබීමෙන් ඇස්තමේන්තු තාත්ත්වික පදනමකින් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | නගරාශ්‍රිත බන්ධනාගාර ආයතනවල තදබදය අවම කිරීමේ අරමුණින් ද, බෝගම්බර බන්ධනාගාරයන්වල ඇති සිර ආහාර සකස් කරනු ලබන බොයිලේරු යන්ත්‍රවල ප්‍රතිසංකරණ කටයුතු හේතුවෙන් ද මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන අවශ්‍යතාවය සම්පූර්ණ කරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශේෂගණයේ සිර හා සැකකරුවන් ආරක්ෂා කිරීමේ යෙදී සිටින නිලධාරීන් වෙත නිකුත් කළ යුතු **9mm** වර්ගයේ පිස්තෝල 120 ක් මිලදී ගැනීම සඳහා 2016,2017 හා 2018 වර්ෂ තුළදී රු.10,884,368 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. පුරප්පාඩු තනතුරු 179 ක් හැර ගිණිඅවියක් නිකුත් කිරීම සඳහා අවසර හිමි නිලධාරීන් 458 ක් සේවයේ යෙදී සිටිය ද මෙම නිලධාරීන් වෙත නිකුත් කළ හැකි වර්ගයේ ගිණිඅවි 136 ක් පමණක් දෙපාර්තමේන්තුව සතුව පැවති අතර එම අවිතුළ භාවිතයට ගත නොහැකි ගිණිඅවි 38 ක් විය. නාවික හමුදාවේ වානිජ පුපුරන ද්‍රව්‍ය ගිණිඅවි හා පතොරොම් මිලදී ගැනීමේ ඒකකය වෙතින් පිස්තෝල මිලදී ගැනීමට කටයුතු කිරීමේ දී අදාල පසුවිපරම් ක්‍රියාමාර්ග අඛණ්ඩව නොගැනීම හා වර්තමානයට ගැලපෙන නවීණ උපකරණ පිළිබඳව අධ්‍යයනය කර ඒ අනුව පිරිවිතර ලබා නොදීම හේතුවෙන් වර්ෂ 03 ක් තුළ අවි මිලදී ගැනීමට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන ගිණිඅවි මිලදී ගෙන නොතිබුණි. | සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහාත්, අවශ්‍ය ආරක්ෂාව සැලසීම සඳහාත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුවේ. | සිදු වූ ප්‍රමාදය පිළිබඳව 2019 පෙබරවාරි 27 දිනැති ලිපිය මගින් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

## 2.2. තැන්පත් ශේෂයන්

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 08 ක 2018 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 112 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | ගිණුම් 02 කට අදාල වර්ෂ 02 ක් ඉක්මවූ රු.199,880 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිලධාරීන්ගේ වැටුපෙන් අයකරගෙන ඇති මෙම ඇප තැන්පතු, නිලධාරියාගේ නමින් ගිණුම් විවෘත කොට තැන්පත් කිරීමට උපදෙස් දී ඇත. |
| (ආ) | සිරකරුවන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සිර වේතන හා පුද්ගලික මුදල් ගිණුමෙහි 2018 | - එම - | සිර වේතන හා පෞද්ගලික මුදල් ගිණුමෙහි ශේෂයන් පවතින බව පිළිගන්නා අතර බොහෝ රැඳවියන්ට |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4.18 ක ශේෂයක් පැවතුණි. නිදහස්ව ගිය ඇතැම් සිරකරුවන්ට සිර වේතන ගෙවා නොතිබීම හා ඇතැම් සිරකරුවන් වෙනුවෙන් ගිණුම් විවෘත කර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි. | | හැඳුනුම්පත් නොමැති වීම නිසා බැංකු ගිණුම් විවෘත කිරීමට නොහැකි වී ඇත. |

## 2.3. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ වර්ෂය අවසානයට වූ ශේෂ පිළිබඳව පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි ස්ථාන මාරු වී මාස 03 ක් ඇතුලත ණය ශේෂය නිරවුල් කල යුතු වුවත් ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.186,136 ක ශේෂයක් පැවති අතර ඉන් රු.92,059 ක මුදලක් වර්ෂ 04 ඉක්මවූ ණය ශේෂ විය. | චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි පිළිපැදිය යුතුවේ. | ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ තොරතුරු සොයා ගැනීමට අපහසු වීම මත ණය අයකර ගැනීමට ප්‍රමාද වී ඇති අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ද සහය ලබා ගෙන මේ පිළිබඳ සාකච්ඡා කර නිරවුල් කිරීම කඩිනමින් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | සේවය හැරගිය නිලධාරීන් 96 ක්, වැඩ තහනම් කළ නිලධාරීන් 68 ක් හා සේවයෙන් පහකල නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 7.07 ක්ද විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 140 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 4.85 ක්ද වතුපිටිවල බන්ධනාගාරය වසා දැමීමෙන් අනතුරුව එහි සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.168,183 ක ශේෂයක් ද අයවී නොතිබූ අතර මෙම ශේෂයන් තුල වර්ෂ 05 ඉක්ම වූ ණය ශේෂයේ වටිනාකම රු.මිලියන 3.98 ක් වී තිබුණි. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කල යුතුවේ. | ප්‍රාදේශිය ලේකම් හා පොලීසිය මගින් නිලධාරීන් දැනුවත් කර ඇති අතර, වැඩතහනමට ලක්වූ නිලධාරීන්ගේ විනය පරීක්ෂණ ක්‍රියාත්මකව පවතී. ඉතිරි ණය මුදල් අයකර ගැනීම සඳහා මෙම වර්ෂයේ දී කටයුතු කරන අතර පැරණි ණය ශේෂයන්ගේ තොරතුරු සොයා ගැනීමට නොහැකි වීම, ණය ශේෂ අඩුවෙන් දැනුම් දීම, ප්‍රතිපාදන වෙන්වුවද ගිණුම් නොතැබීම, මරණ පාරිතෝශිකය සඳහා හිමිකම් නොපෑම, වසාදැමූ බන්ධනාගාරයේ ණය ශේෂයන් මාරු නොකිරීම යනාදී හේතු නිසා මෙම ණය |

| | | | |
|---|---|---|---|
| | | | අයකර ගැනීමට නොහැකි වී ඇති අතර එම විස්තර හා තොරතුරු පරීක්ෂා කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ණය මුදල් අයකර ගැනීමේ දී නිලධාරීන් 11 දෙනෙකුගෙන් රු.114,402 ක මුදලක් වැඩිපුර අයකරගෙන තිබූ අතර 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 හි විධිවිධානවලට අනුගත නොවීමෙන් උපරිම ණය හිමිකම වූ රු.250,000 ක සීමාව ඉක්මවා නිලධාරීන් 08 දෙනෙකු වෙත ලබා දුන් ණය ශේෂයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.11 ක් වී තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 හි උපදෙස් පිළිපැදිය යුතුවේ. | වැඩිපුර මුදල් අයකරගත් නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයාගෙන එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙසත්, වැඩිපුර ගෙවීම් කර ඇති මුදල් අයකර ගැනීමටත් හා මෙවැනි තත්ත්වයන් ඉදිරියේ දී ඇති වීම වැලැක්වීමටත් අධිකාරීවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. |

**2.4.** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,170.78 ක් වූ බැරකම් හා බැඳීම් අවස්ථා 2,306 ක් පැවතුණු අතර මුදල් රෙගුලාසි 91 විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 06 ක රු.මිලියන 1.65 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.මිලියන 44.66 ක බැරකම්වලට බැඳී තිබුණි. එය අනුමැතියකින් තොරව ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමක් ලෙස නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ අදාල විධිවිධාන අනුගමනය කළ යුතුවේ. | විගණන නිරීක්ෂණයේ සඳහන් කරුණු පිළිබඳව එකඟ වෙමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 1939 අංක 28 දරන බාලාපරාධකාර (අභ්‍යාස පාඨමාලාව) ආඥාපනතට අනුව තරුණ | ප්‍රශස්ත මට්ටමින් අරමුණු ඉටු කරවා ගැනීමට | අපරාධ ආඥාපනතේ 35 ප්‍රකාරව කටයුතු කිරීම සඳහා |

වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට ඇතුලත් කිරීමේ දී අදාල වාර්තා රහිතව දරුවන් ඇතුලත් කර තිබීම හේතුවෙන් මෙම පාසලේ අධ්‍යාපනය ලබා දීමට යෝග්‍ය නොවන හා මූලික සුදුසුකම් රහිත දරුවන් පාසල වෙත යොමු කර තිබීම, දරුවන්ගේ වයස් මට්ටම හා අධ්‍යාපන මට්ටම අනුව පාසලේ අධ්‍යාපනය සැලසුම් කර නොතිබීම, අධ්‍යාපනය දීමට පෙර හෝ අධ්‍යාපනය ලබමින් සිටියදී විවිධ වැරදි ක්‍රියා හේතුවෙන් වැරදිකරුවන් වී තිබූ මෙම දරුවන් සාර්ථක පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කර නොතිබීම, මෙම දරුවන් වඩාත් කැමති වෘත්තීය පුහුණුව ලබා දීම කෙරෙහි අවධානය යොමු කර නොතිබීම, ප්‍රමාණවත් ඉඩකඩ රහිතව දරුවන් රඳවා තිබීම වැනි හේතුන් මත අසාර්ථක ක්‍රමවේදයක් යටතේ බන්ධනාගාර පාසල ක්‍රියාත්මක වී තිබුණි. බොහෝ දරුවන් අධ්‍යාපනය සඳහා පාසලට යවනුයේ ද ළමුන්ගේ අකමැත්තෙන් බවත්, පාසලේ ඉගැන්වීම් කටයුතු සඳහා අනුයුක්ත කර තිබූ ගුරුමණ්ඩලය සඳහා විශේෂ පුහුණුවක් ලබා දී නොතිබූ බවත් බන්ධනාගාර පාසලේ පරිපාලන කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

බන්ධනාගාර පාසල සහිත වටරැක බන්ධනාගාර වැඩකඳවුර වටා ආරක්ෂිත වැටක් හෝ තාප්පයක් ඉදි කර නොතිබීම, බෝවන රෝග වැලඳුන අවස්ථාවලදී රෝගීන් වෙන් කර තැබීමට පහසුකම් නොතිබීම, හෘද ස්පන්ධනය මැනීමේ උපකරණ, රුධිර පීඩන මැනීමේ උපකරණ වැනි නවීන සෞඛ්‍යය උපකරණ නොමැතිවීම, හෙද නිලධාරීන් හා ඖෂධ නිලධාරීන් හිගය, නිවාඩු යන නිලධාරියෙකු වෙනුවට යෙදවීමට තවත් එක් නිලධාරියෙකු හෝ නොසිටීම වැනි සෞඛ්‍යය පහසුකම් ද ඉතා අවම මට්ටමක පැවතුණි.

බන්ධනාගාර නිත්‍ය නියෝග 962 අනුව නිවාසපති පාලනය යටතේ තරුණ වරදකරුවන් පළමු වසර පළමු නිවාසයේ ද දෙවන වසර දෙවන නිවාසයේ ද තෙවන වසර තෙවන නිවාසයේ ද වශයෙන් රඳවාතැබීම් කළ යුතු වුවත් වර්තමානයේ එම ක්‍රමවේදය ක්‍රියාත්මකව නොතිබුණි.

කටයුතු කල යුතුවේ.

මහේස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කිරීමට අධිකරණ කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා ඇති අතර යෝග්‍යතාවය සලකා බලා දඩුවම් නියම කිරීමට අදාල පෝරම යොදා ගැනීමටත්, දරුවන්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදාල ආයතන එක්ව වැඩපිළිවෙලක් සකස් කිරීමටත් සාකච්ඡා කර ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රමවේදයක් ආරම්භ කිරීමේ කටයුතු සාකච්ඡා කරමින් පවතී.

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර වසර 07 කට ආසන්න කාලයක් ගතව ඇති හා රු.මිලියන 101 කට ආසන්න වියදමක් දරා ඇති බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැලිකඩ බන්ධනාගාරය ජාලගත කිරීම 2016 වර්ෂයේ දී රු.957,978 කට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන වෙත භාර දී තිබූ අතර බන්ධනාගාර ආයතන 12 ක් ජාලගත කිරීම 2018 වර්ෂයේ දී රු.මිලියන 30.51 කට පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණි. තවත් ආයතන 16 ක් ඉදිරියේ දී ජාලගත කිරීමට නියමිතව පැවතුණි. සියලු ආයතන එකවර ජාලගත කර එහි වගකීම හා අවදානම එක් ආයතනයක් වෙත භාර දීම තුලින් තොරතුරු පද්ධතිය සියලු ආයතනවල ක්‍රියාත්මක කිරීම හා පිරිවැය අවම කර ගැනීම මෙන්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අවදානම අඩු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. තොරතුරු පද්ධතිය සියලු ආයතනතුල ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සිර මාරුකිරීම් වැනි එහි ඇතැම් අංශ ක්‍රියාත්මක වුවද අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | එකම ප්‍රසම්පාදනයන් එකවර සිදු කිරීමෙන් වියදම් අවම කර ගැනීමටත්, අවදානම අවම කර ගැනීමටත්, නඩත්තු හා දෝශ නිරාකරණය කර ගැනීම කාර්යක්ෂමව සිදු කිරීමටත් කටයුතු කළ යුතුවේ. තොරතුරු පද්ධතිය කඩිනමින් සියලු ආයතනවල ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගත යුතුවේ. | ප්‍රතිපාදන නොලැබීම මත බන්ධනාගාර ආයතන සියල්ල එකවර ජාලගත කිරීමට නොහැකි වූ අතර ප්‍රතිපාදන ලැබුනහොත් ඉතිරි බන්ධනාගාර ආයතන 16 ඉදිරියේ දී ජාලගත කිරීමට අපේක්ෂිතය. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ඔක්තෝබර් 04 දින රු.30,519,301 ක් වැය කර බන්ධනාගාර ආයතන 12 ක පරිගණක ජාල ස්ථාපනය කිරීම, සැකසුම් කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදනය කිරීමේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූලව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර නිවැරදිව ප්‍රසම්පාදන වර්ගය තෝරා ගනිමින් ගිවිසුම් ගත | එක් එක් උපාංගයන් සඳහා වන පිරිවිතරයන් හි නඩත්තු හා වගකීම් කොන්දේසි වෙන වෙනම දක්වා ඇති අතර ඒවාට එකඟ බව ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීමේ දී සඳහන් කර |

| | | | |
|---|---|---|---|
| | කාර්යය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ඡේදය අනුව ලංසුවක් ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එම ලංසුකරුට එසැනින්ම විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කළ යුතු වුවත් බන්ධනාගාර ආයතන 12 ක් ජාලගත කිරීමේ දී පරිගණක ජාලගත කිරීමේ උපකරණ සැපයීම, සවිකිරීම හා සැකසුම් කිරීම සඳහා පමණක් 2018 ඔක්තෝබර් 15 දින පෞද්ගලික ආයතනයක් සමග කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර ප්‍රසම්පාදන වර්ගය තෝරාගනිමින් සේවා ගිවිසුමකට ඇතුලත් විය හැකි පරිදි ප්‍රසම්පාදන ගිවිසුමකට එළඹ නොතිබුණි. | විය යුතුවේ. | ඇත. |
| (ආ) | සියලු බන්ධනාගාර ආයතනවල අවශ්‍යතා සලකා බලා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර මධ්‍යගතව මිලදී ගත යුතු වායු සමීකරණ යන්ත්‍ර, රූපවාහිණී, මේස පුටු වැනි උපකරණ මෙන්ම පුද්ගල පරීක්ෂා කිරීමේ යන්ත්‍ර අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් ලබා ගැනීම, පරීක්ෂා කිරීම, අනුමැතියට යොමු කිරීම හා ඇණවුම් පිළියෙල කිරීම් වැනි කාර්යයන් බන්ධනාගාර ආයතනවල ගබඩා භාරකරු ඇතුළු නිලධාරීන් විසින් ඔවුන්ගේ විෂයය පථයෙන් පරිභාහිරව සිදු කර තිබූ අවස්ථා පැවතුණි. 2019 අප්‍රේල් 29 දින රු.107,525 කට වායුසමීකරණ යන්ත්‍රයක් මිලදී ගැනීම හා 2018 මාර්තු 28 දින රු.62,675 ක් වැය කර පුද්ගල පරීක්ෂා කිරීමේ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම මෙම අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ සිදු කර තිබූ අතර ඒ සඳහා බන්ධනාගාර අධිකාරීවරයා වෙත බලය පැවරීමක් ද සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධති නිසි පරිදි ක්‍රියාවේ යෙදවිය යුතුවේ. | 2018 වර්ෂයට මු.රෙ.135 යටතේ බළතල පැවරීමේ නියෝග අනුව බන්ධනාගාර අධිකාරීවරයෙකුට රු.50,000 ක උපරිමය දක්වා ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැක. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ධාවනය වන වාහන 21 ක් හා ධාවන තත්ත්වයේ නොපවතින වාහන 32 ක් දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර නොමැති වාහන වූ අතර, 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හි උපදෙස් අනුගමනය නොකිරීම හේතුවෙන් 2019 ජනවාරි මාසය වන විට ක්‍රියාවිරහිතව මාස 03 සිට අවුරුදු 09 දක්වා කාලයක් ගතව ඇතත් ඵලදායි ආර්ථික කටයුත්තකට යොදා නොගැනීම හේතුවෙන් ස්වභාවික උපද්‍රවයන්ට ලක්ව විනාශ වෙමින් පවතින වාහන 43 ක් ද විය. එසේම අපහරණය කිරීම සුදුසුයැයි තීරණය කර ඇති වාහන 16 ක් එම කරුණු වාර්තා වී වර්ෂ 01 සිට වර්ෂ 03 ක් දක්වා කාලයක් ගතවුව ද අපහරණය කිරීමට කටයුතු කර නොතිබීමත්, වාහන 53 ක් සඳහා වාහන ලියාපදිංචි සහතිකය, රක්ෂණ සහතිකය හා ආදායම් බලපත්‍රය නොමැතිවීම හේතුවෙන් දෙපාර්තමේන්තුව නමින් පවරාගෙන ලියාපදිංචි කර නොතිබූ බවත් එකී වාහන අතුරින් වාහන 08 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර අංකයක් හෝ ලබාගත් වාහන නොවන බවත් නිරීක්ෂණය විය. | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි කටයුතු කල යුතුවේ. | 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හි උපදෙස් අනුව කටයුතු කිරීමටත්, වාහන පරීක්ෂා කිරීමේ කමිටුව විසින් දෙන උපදෙස් මත ඉදිරි පියවර ගැනීමටත්, සමස්ථ වාහන පිළිබඳ පාලනය අධිකාරීවරයෙකුට පැවරීමටත් කටයුතු කරමි. |
| (ආ) | අක්කර 33 රූඩ් 1 පර්චස් 11 කින් සමන්විත අත්තනපොලවත්ත නැමති වටරැක එළිමහන් වැඩකඳවුර පිහිටා ඇති ඉඩම 2018 දෙසැම්බර් 07 දින වන විටත් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉඩම පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 විධිවිධානවල සඳහන් ආකෘතිය ප්‍රකාර පවත්වන ලද හානි පිළිබඳ ලේඛනයක සිද්ධීන් 203 කට අදාල මුළු එකතුව රු.මිලියන 55.79 ක් වූ හානි පිළිබඳ විස්තර විධිමත් පරිදි වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 විධිවිධාන පිළිපැදිය යුතුවේ. | මූලික තොරතුරු අදාල ආයතනවල ඇති බැවින් මූලික කටයුතු එම ආයතන මඟින් ඉටු කර මූලස්ථානය වෙත යොමු කිරීමට උපදෙස් නිකුත් කර ඇත. |
| (ආ) | 2017 වර්ෂයේ වාහන අනතුරු 05 ක් ඇතුලුව වාහන අනතුරු 06 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ඒවායේ පාඩුව තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන පිළිපැදිය යුතුවේ. | මෙම අනතුරු හා සම්බන්ධ ආයතනවල අධිකාරීවරුන් වෙත දන්වා තොරතුරු ලබා ගෙන පරීක්ෂණ කටයුතු අවසන් කරන ලෙස වාහන අනතුරු කමිටුව වෙත උපදෙස් දී ඇත. |
| (ඇ) | 2011 සැප්තැම්බර් 23 දින අනතුරට පත්ව තිබූ වාහනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව පරීක්ෂණ පවත්වා ක්‍රියාමාර්ග නොගැනීම හා වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් හානියට පත්ව අපහරණය කිරීමට සිදුව තිබුණි. එහි පාඩුව නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමටත් වාහනය සම්පූර්ණයෙන් හානිවීමේ පාඩුවට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි. අනතුරින් පසු 2017 වර්ෂයේ දී රු.400,000 ක් අනතුර සිදු කළ නිලධාරියාගෙන් අයකරගෙන තිබුණ ද එම මුදල අලාභයක් ලෙස දිගින් දිගටම ගිණුම්වල දක්වමින් ඉදිරියට ගෙනවිත් තිබුණි. | මුදල් රෙගුලාසි 104 විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2011 වර්ෂයේ දී සිදු කර තිබූ මෙම අනතුර සඳහා වගකිව යුතු නිලධාරියා රු.400,000 ක් ගෙවා ඇති අතර අලාභය පොතෙන් කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙතින් අනුමැතිය ඉල්ලා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතු පාඩු රු.මිලියන 7.07 ක් වූ වාහන අනතුරු 90 ක්, වසර 5 - 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 28 ක් අතුලු සිද්ධීන් 30 කට අදාල එකතු පාඩු රු.මිලියන 32.46 ක්, වර්ෂ 05 කට වඩා අඩු කාලයක සිට පැවත එන එකතු පාඩු රු.මිලියන 13.71 ක් වූ වාහන අනතුරු 62 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 103(1) සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගෙන පාඩු අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. මෙම වටිනාකම් දිගින් දිගටම ගිණුම්වල දක්වමින් ඉදිරියට ගෙනවිත් තිබුණි. 2018 වර්ෂයේ රු.මිලියන 2.54 ක් වූ වාහන අනතුරු 27 ක් සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි 103(1) පරිදි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 103 විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අනතුරු හා දේපළ හානි නිසිලෙස වාර්තා කිරීමේ හා මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමේ දුර්වලතා නිසා පාඩුව හෝ හානිය අයකර ගැනීමට හෝ ශේෂයක් තිබේනම් පොත්වලින් ඉවත් කිරීම හෝ සිදු කර නොමැති බව පිළිගනිමි. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | නියාමක තනතුරට නිලධාරීන් 1,184 ක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්, අමාත්‍යාංශ නිලධාරීන් හා බන්ධනාගාර නිලධාරීන් විසින් එකඟ වූ පරිදි බඳවා ගැනීමේ පටිපාටියේ වූ බඳවා ගැනීමේ ක්‍රමය යටතේ තරඟ විභාගයක් ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් මත සම්මුඛ පරීක්ෂණ මත නියාමක නිලධාරීන් බඳවාගැනීමට සැලසුම් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින්ට ගෙවීම, ක්‍රීඩා නිලධාරීන්ට ගෙවීම, අතිකාල හා වෙනත් වියදම් සහ සංග්‍රහ කටයුතු යනාදි වියදම් වෙනුවෙන් රු.මිලියන 4.23 ක් දරා තිබුණ ද විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යමණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් මෙම බඳවාගැනීම් අවලංගු කර තිබුණි. ඒ හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික වී තිබුණි. | බඳවාගැනීමේ පටිපාටිය නිසියාකාරව සකස් කර විධිමත් පරිදි බඳවාගැනීම් සිදුකළ යුතු වීම. | රේඛීය අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම තාවකාලිකව නතර කිරීමත්, අමාත්‍යමණ්ඩල සංදේශයක් මත බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කර තරඟ විභාගයක් ඇතුලත් කිරීමට නිර්දේශ කිරීමත් දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ අතර මාරු වීම හා අමාත්‍යවරුන් වෙනස් වීමත් මේ සඳහා බලපෑ හේතු විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හා සහාය කාර්ය මණ්ඩලය සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් වැය වූ රු.මිලියන 1.68 ක මුදලද ඉහත වියදම තුල ඇතුළත් විය. මෙම සංග්‍රහ වියදම සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 අනුව සෘජු මිලදී ගැනීම් සඳහා වැය කළ හැකි උපරිම මුදල රු.500,000 කට සීමා වී තිබුණද එම සීමාව ඉක්මවා වියදම් දරා තිබුණි. තවද නිලධාරීන්ට අතුරු අග්‍රිම ලබා දීම මගින් ගෙවා ඇති මෙම මුදල සඳහා භාණ්ඩාගාරයේ පූර්ණ අනුමැතිය ලබා නොතිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි හෝ වෙනත් ආකාරයෙකින් විධිවිධාන සලසානොගෙන දරා තිබූ මෙවැනි වියදම් රජයේ මුදල් නිසි කලමනකරණයකින් හා පාලනයකින් තොරව දැරූ වියදම් ලෙස නිරීක්ෂණය විය. | රජයේ මුදල් නිසි පාලනයකින් හා කළමනාකරණයකින් යුතුව වැය කළ යුතුවේ. | මෙම කඩිනම් ක්‍රියාවලිය තුළ මහා භාණ්ඩාගාරයේ පූර්ණ අවසරය ලබා ගැනීමට අතපසු වූවද මෙම වියදම් ඉතා අරපරිස්සමෙන් සහ අවශ්‍ය කාර්යය සඳහා පමණක් දරන ලදී. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | කාර්යමණ්ඩල පුහුණුව සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 3.04 ක් උපයෝජනය කර තිබුණු නමුත් බන්ධනාගාර ආයතන 25 ක නිලධාරීන් 1831 දෙනෙකු සඳහා කිසිදු ආකාරයේ පුහුණුවක් ලැබී නොතිබීම, ආයතන 23 ක නිලධාරීන් සඳහා සේවා ආරම්භක පුහුණුවට අමතරව වෙනත් කිසිදු පුහුණු අවස්ථාවක් හිමිව නොතිබීම හා බොහෝ නිලධාරීන්හට අවම වශයෙන් ආසන්න වර්ෂ 05 ක කාලය තුළදී හෝ පුහුණු අවස්ථා හිමිව නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව සතුව පවතින පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමෙන් නිලධාරීන්ට නිරන්තර පුහුණු අවස්ථා ලබා දී ආයතනික මට්ටමින් කාර්යක්ෂමව හා ඵලදායී සේවාවක් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | 2019 වර්ෂයේ දේශීය පුහුණු සඳහා රු.මිලියන 5 ක් වෙන් කර ගැනීමට කටයුතු සලසාගෙන ඇති අතර මේ වන විට දිවයින පුරා ආයතනයන්හි සේවයේ නියුතු සියළු නිලධාරීන් හට අවශ්‍ය පුහුණු හා පාඨමාලා සම්බන්ධ තොරතුරු ඇතුළත් අයදුම්පත් කැඳවීම සිදුකර ඇත. |
| (ආ) | බන්ධනාගාර ආයතන විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව පුහුණුව හිමි නොවූ සිය රාජකාරී ඉටුකරන කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම උදෙසා ගිනිඅවි, ප්‍රථමාධාර, ගිනි නිවීම, මානවසම්පත් කළමනාකරණ, මානසික | කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණු කිරීම් සිදු කළ යුතුවේ. | 2019 වර්ෂයේ දේශීය පුහුණු සඳහා රු.මි.5ක් වෙන් කර ගැනීමට කටයුතු සලසාගෙන ඇති අතර මේ වන විට දිවයින පුරා ආයතනයන්හි |

| | | | |
|---|---|---|---|
| | ආතති කළමනාකරණය, මානව හිමිකම්, පරිගණක, දෙවන භාෂා, කාර්යාල ක්‍රම හා නීති රීති රෙගුලාසි ආදි පුහුණු අවශ්‍යතා නිලධාරීන් හට මතුව තිබුණි. | | සේවයේ නියුතු සියළු නිලධාරීන් හට අවශ්‍ය පුහුණු හා පාඨමාලා සම්බන්ධ තොරතුරු ඇතුළත් අයදුම්පත් කැඳවීම සිදුකර ඇත. |
| (ඇ) | කුරුවිට බන්ධනාගාර ආයතනය හා කුරුවිට ප්‍රාදේශිය සභාව අතර එකඟතාවය මත ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාර කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ගිවිසුමට පටහැනිව කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් රු.120,000 ක් බන්ධනාගාර නියාමකවරයෙකුට ගෙවා තිබුණු අතර කුරුවිට ප්‍රාදේශිය සභාවෙන් අයවිය යුතු රු.336,907 ක මුදල බන්ධනාගාරයට ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුවේ. | ගිවිසුම්වලට පටහැනිව සුපරීක්ෂක ගාස්තු ලෙස රු.10,000 ක් බැගින් වර්ෂයකට රු.120,000 ක් කුරුවිට ප්‍රාදේශිය සභාව ගෙවීම් කර ඇති අතර 2008 වර්ෂයේ දී ආයතනයට හිමි විය යුතු මුදල සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාවේ සභාපති ලිඛිතව දැනුවත් කර ඇත. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර පාලන දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුරුවිට බන්ධනාගාරය තුළ සිදු කළ විශේෂ විගණනයට අනුව නිරීක්ෂණය වූ පරිදි බන්ධනාගාර අධිකාරීවරයාගේ ලිඛිත උපදෙස් මත මසකට හය හත් වතාවක් සිර වාට්ටු සෝදිසි කිරීම් කල ද විවිධ උපක්‍රම යොදා ගනිමින් සිම් කාඩ්පත්, ජංගම දුරකථන, දුංකොළ, බැටරි හා මත්ද්‍රව්‍ය යනාදි නිති විරෝධි ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට රැගෙන එන බව වාර්තා වී තිබුණි. අදාල පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර වාර්තා ලේඛනගත කර නොතිබීමත්, කොපමණ අනවසර ද්‍රව්‍ය හඳුනාගත්තේ ද හා ඒ සඳහා කුමන පුද්ගලයින්ට දඬුවම් පැමුණුවේ ද යන්නත් පිළිබඳ වාර්තා ආයතනය සතුව නොතිබීමත් හේතුවෙන් දුර්වලව පවතින අභ්‍යන්තර පාලනය නවීන තාක්ෂණික ක්‍රම උපයෝගිකර දියුණු කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පැවති බව නිරීක්ෂණය විය. | ක්‍රමවත් වැඩ පිළිවෙලක් මත තහනම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීම් පිළිබඳව ලේඛන ගත කර අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය හා පුද්ගලයින් පිළිබඳව ද ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුවේ. | අත්අඩංගුවට ගත් තහනම් ද්‍රව්‍ය විනාශ කර ඇති අතර මෙවැනි තහනම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ ලේඛනයක් නඩත්තු කරන ලෙස බන්ධනාගාර අධිකාරී වෙත උපදෙස් ලබා දී ඇත. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යමණ්ඩල පුරප්පාඩු 2138 ක් පැවතීම හේතුවෙන් බන්ධනාගාර ආයතනවල ආරක්ෂණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමේ අපහසුතා ඇති වී තිබීමත්, බොහෝ බන්ධනාගාර ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් ද්විත්ව හා ත්‍රිත්ව සේවයේ යෙදවීමට සිදුවීමත්, ආයතනවල ගිණුම් කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමේ අපහසුතා ඇති වීමත්, බන්ධනාගාර ආයතනවල කාර්යාල කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමේ අපහසුතා ( ලිපි සම්බන්ධ කටයුතු/ නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු) ඇති වීමත්, නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරී බහුලතාවය මත බොහෝ නිලධාරීන් මානසික පීඩනයෙන් පෙලීමත්, අභ්‍යන්තර ස්ථානමාරු ලබා ගැනීමේ දී ගැටළු සහගත තත්ත්වයක් ඇතිවීමත්, බන්ධනාගාරය තුළ සිරකරුවන්ගේ අධීක්ෂණයට නිලධාරීන් ප්‍රමාණවත් නොවන බැවින් බන්ධනාගාර තුළ විවිධ අක්‍රමිකතා, දූෂණ සිදුවීමත්, ආරක්ෂණ රාජකාරී සඳහා ප්‍රමාණවත් නිලධාරීන් නොවන බැවින් සිරකරුවන් පලායාම සිදුවීමත්, නිලධාරීන්ට පුහුණු හා පාඨමාලාවන් සඳහා යොමුවීමට ඇති දුෂ්කරතා තිබීමත් යනාදි අඩුපාඩු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා බාධාවකින් තොරව ඉටුකළ නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | ඉහළ කළමනාකරණය විසින් අදාල ආයතන සමග සම්බන්ධ වී පුරප්පාඩු පියවා ගැනීමට කටයුතු කල යුතුවේ. | විගණන නිරීක්ෂණයේ දක්වා ඇති කරුණු සමඟ එකඟ වන අතර අඩුපාඩු, ගැටළු හා බාධාවන් අවම කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |